The Journal of Studies in Humanities

Volume 4 (II) 2018

Department of Humanities, Rajarata University of Sri Lanka

# ලිංගිකත්ව සන්නිවේදනයේ දී මාධ්‍ය භාවිතය පිළිබඳ සමාජ සමීක්ෂණාත්මක අධ්‍යයනයක්

(උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන් ඇසුරෙන් සිදු කරන ලද සමීක්ෂණයක් ඇසුරෙනි)

**නන්දන මිල්ලගල**

මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, සමාජීය විද්‍යා හා මානවශාස්ත්‍ර පීඨය,
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය, මිහින්තලේ.

*Email: nandana.millagala58@gmail.com*

## Abstract

Sexual communication is related to sex and gender. It has a biological and sociological base. Sexuality is the main natural characteristic factor which classify the whole human socity. Accordingly sexuality is the change that the most difficult to change in the world. The communication is happened based on the inherent physical and mental characteristics of men and women. According to social factors that spread from the family unit sexual communication creats their own identity. This has profound impact on human education as well as on entertainment , and has caused many social problems crises and conflicts. The main objective of this research is to study the possibilities for managing such social problems by developing sexual communication educationally and aesthetically. Analizing the data obtaind from the research conducted by internal and external university under graduates has sought to achieve these objectives.

**Keywords:** Insemination, Zygote, Sexual Intercourse, Orgasm, Stimulus

## හැඳින්වීම

ලිංගිකත්වය (sexuality) වනාහි සත්ත්ව සන්තතිය සතු නෛසර්ගික ජීවවිද්‍යාත්මක ව්‍යවහාරයකි. එය සත්ත්ව හා ශාක යන ජෛව සාධක ප්‍රභේද දෙකටම අනන්‍ය වන බව ප්‍රකට වේ. මිනිසුන් අතර ගැහැනු-පිරිමි බව පවත්නාසේම සතුන් හා ශාක අතර ද මෙය දැකිය හැකි ය. ලිංගිකත්වය ස්ත්‍රි-පුරුෂ අනන්‍යතාව නිරූපණය කරන අතරම ඔවුනොවුන් අතර පවත්නා වෙනස්කම් ද දක්වයි. එනම් ස්ත්‍රීන් හා පුරුෂයින් අතර ජීවවිද්‍යාත්මක වශයෙන් පවත්නා ස්වභාවය ලිංගිකත්වය යන්නෙන් තහවුරුවන බවයි. එහෙත් ස්ත්‍රී-පුරුෂ

සමාජ භාවය, පුම්තිරි බව නොහොත් ස්ත්‍රී-පුරුෂ භාවය Gender යන වචනයෙන් අරුත් ගැන්වේ. මෙම විමර්ශනයට අනුව ලිංගිකත්ව සන්නිවේදනයට (sexual Communication) ස්ත්‍රී-පුරුෂ ජීවවිද්‍යාත්මක මෙන්ම එහි සමාජ විද්‍යාත්මක පදනම ද අදාළ කර ගැනීමට සිදු වේ. මන්ද යත් සන්නිවේදනයේ දී මෙකී පාර්ශව දෙකට අයත් වන බැවිනි. ලිංගිකත්ව සන්නිවේදනයේ දී එහි අධ්‍යාපනික හා වින්දනාත්මක පාර්ශවයන් පිළිබඳව ද වැඩි අවධානයක් යොමු වේ. ස්ත්‍රීන් සහ පුරුෂයින් සතු කායික සාධක ලෙස ගැනෙන ඇස, කණ, නාසය, දිව, ශරීරය යන ඉන්ද්‍රියන් ඔවුනොවුන්ගේ සන්නිවේදනයේ දී ක්‍රියාත්මක වේ. එසේම මානසික හෝ චිත්තවේගීය ලක්‍ෂණයේ ගැනෙන ආදරය, ආලය, ප්‍රේමය, සෙනෙහස, රතිය, කාමය වැනි මනෝමය ලක්‍ෂණ ඒත් සමගම ක්‍රියාත්මක වේ. ඒ අනුව ලිංගිකත්ව සන්නිවේදනය සිදුවන්නේ ඒ ඒ ස්ත්‍රී-පුරුෂ ලිංගිකයන්ගේ කායික හා මානසික ක්‍රියාකාරිත්වයන් සහිත ජෛවීය ක්‍රියාවලිය සමගිනි. එසේම පවුල් ඒකකයේ සිට විහිද යන සමාජ හැසිරීම් ක්‍රියාවලිය ස්ත්‍රීන්ට හා පුරුෂයන්ට ආවේණික වූ සමාජ සන්නිවේදනාත්මක භාවිතයන් පවතී.

මිනිසා ස්වකීය ජීවිතයට අදාළ අධ්‍යාපනික හා සෞන්දර්ය රස සංජානනීය පරාසයන් නිර්මාණය කර ගන්නේ මෙකී ජෛවීය හා සමාජමය ලිංගිකත්ව සන්නිවේදනයන් ආශ්‍රයෙනි. එහි උපරි ඵලය වන්නේ නව ජීවිතයට ජන්මය ලබාදීමයි. ස්ත්‍රියගේ ඩිම්බයක් නිකුත්වීම හා පුරුෂයකුගේ ශුක්‍රාණුවක් නිකුත්වීම දක්වාවන දැනුම් ඉන්ද්‍රිය හා ස්නායු පද්ධතිය ආශ්‍රිත සන්නිවේදන ක්‍රියාවලියක් සිදු වේ. ඒ අනුව ස්ත්‍රී බීජය හා පුරුෂ බීජය සංසේචිතව යුක්තානුව හෙවත් නව ජීවියා හටගනී. ක්‍රමිකව වැඩෙනවිට එම ජීවියා ද ස්ත්‍රී හෝ පුරුෂ හෝ ලිංගිකත්ව අනන්‍යතාවකට යටත් වේ. කුමනාකාර තාක්‍ෂණික මාධ්‍ය භාවිතා කළ ද අවසන එය මිනිසෙක් (ස්ත්‍රියක් හෝ පුරුෂයෙක්) තුළට ගමන් කරන්නේ ඔවුනට ආවේණික වූ ජෛව රසායන ක්‍රියාවලියකට පාත්‍රවීමෙනි. එවැනි සන්නිවේදනයන් මගින් පුද්ගලයින් වෙත දැනුම, ආකල්ප මෙන්ම චර්යාත්මක පෙළඹවීම්වලට අදාළ අධ්‍යාපනික සන්නිවේදනයක් හෝ ඔවුන්ගේ භාවමය පිනවීමකට අදාළ වන සෞන්දර්යාත්මක සන්නිවේදනයක් සිදුවිය හැකිය. එබැවින් ලිංගිකත්ව සන්නිවේදනය යනු ඉතා පුළුල් සමස්ත මානව වර්ගයාම නියෝජනය කළ හැකි ක්ෂේත්‍රයක් වේ. ජාති, ආගම්, වර්ණ, ගෝත්‍රාදී ද්විතියික බෙදීම්වලදී සංස්කෘතික හා සමාජමය වශයෙන් ඇතිවන්නා වූ වෙනස්කම් පැවතිය ද පොදු මානව ධර්මානුකූල සාධකයන් මිනිස් යන ප්‍රභේදයට යටත්ව සිදුවේ. එබැවින් මෙම පර්යේෂණ අධ්‍යයනය වඩාත්ම අවශ්‍ය වන්නකි. එසේම මානව සමාජයේ නොයෙකුත් ගැටලු, අර්බුද හා ගැටුම් නිර්මාණය වීමේදී ඒ සඳහා ලිංගිකත්ව සාධකය ප්‍රබල හේතුවක් බවට පත් වේ. ඒ සඳහා සන්නිවේදනය, අධ්‍යාපනය මෙන්ම ආස්වාදය පිළිබඳ කරුණු බලපාන බව ද පැහැදිලි වේ. ඒ අනුව ද මෙම පර්යේෂණය කාලීන වශයෙන් වැදගත් වේ.

## ගැටලුව

ලිංගිකත්වය (Sexuality) හා සන්නිවේදනය (Communication) අතර සම්බන්ධතාව හඳුනාගනිමින් ලිංගිකත්ව සන්නිවේදනය (Sexual Communication) යනු කුමක්දැයි අර්ථකථනය කර ගැනීමත් එහිදී අධ්‍යාපනික හා සෞන්දර්යාත්මක වශයෙන් ලිංගිකත්ව සන්නිවේදනයේ පවත්නා සම්බන්ධතාව කුමක්දැයි විමර්ශනය කිරීමත් මුඛ්‍ය ගැටලු බවට පත් වේ.

**අරමුණු**

ලිංගිකත්වය (Sexuality) හා සන්නිවේදනය (Communication) ඔස්සේ ලිංගිකත්ව සන්නිවේදනය (Sexual Commuication) යන්න ගොඩ නැගෙන ආකාරය ශාස්ත්‍රීය මූලාශ්‍රය පරිශීලනය ඇසුරින් අධ්‍යයනය කරමින් අර්ථ නිරූපණය කර ගැනීම ප්‍රවේශීය අරමුණක් බවට පත් වේ. එසේම අධ්‍යාපනය හා සෞන්දර්ය විෂයෙහි ලා ලිංගිකත්ව සන්නිවේදනයේ අදාළතාව අධ්‍යයනය කිරීම මුඛ්‍ය වශයෙන් අවධානය යොමු වන අරමුණකි. විශේෂයෙන් මානව ජීවිතයේ ලිංගිකත්වයට ප්‍රබල කායික හා මානසික සූදානමක් සහිත වයස් කාණ්ඩයක් නියෝජනය කරන මෙන්ම අධ්‍යාපනයට මෙන් සෞන්දර්ය ආස්වාදය කෙරෙහි නැඹුරුතාවක් සහිත තරුණ ප්‍රජාවක් නියැදියක් ලෙස තෝරා ගෙන ඔවුන් ප්‍රස්තුත තේමාව විෂයෙහිලා දක්වන ප්‍රතිචාර හා අදහස් විශ්ලේෂණය කරමින් ලිංගිකත්ව සන්නිවේදනයේ දී අධ්‍යාපනික හා සෞන්දර්ය මාධ්‍ය භාවිතය පිළිබඳ තොරතුරු අනාවරණය කර ගැනීමක්, නව යෝජනා ඉදිරිපත් කරමින් නිගමනවලට පැමිණීමත් ප්‍රධාන අරමුණු බවට පත් වේ.

**ක්‍රමවේදය**

පර්යේෂණ අධ්‍යයනයට අවශ්‍ය පදනම් ප්‍රවේශය ගොඩනගා ගැනීමේ දී ලිඛිත මූලාශ්‍රය පරිශීලනය කිරීම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන් ලිංගිකත්වය හා සන්නිවේදනය පිළිබඳවත් අධ්‍යාපනය හා සෞන්දර්ය පිළිබඳවත් ලියැවුණු කෘති පිළිබඳ වැඩි අවධානයක් යොමු කෙරේ. මෙම පර්යේෂණයේ දී තෝරාගත් ප්‍රජා කණ්ඩායම ආශ්‍රයෙන් තොරතුරු ලබාගැනීමට ප්‍රශ්නාවලී ක්‍රමය උපයුක්ත කරගන්නා ලදි. එහිදී මූලික තොරතුරු ලබාගැනීම සඳහා මෙන්ම පර්යේෂණ කේන්ද්‍රීය තොරතුරු ලබාගැනීමට අදාළ ප්‍රශ්න 50 ක් පමණ ඇතුළත් කර ප්‍රශ්නාවලිය භාවිත කර ඇත. පර්යේෂණයට අවශ්‍ය පෝෂණය ලැබීම සඳහා සුදුසු පුද්ගලයින් මෙන් ම මුඛ්‍ය තේමාව සම්බන්ධ ප්‍රාමාණිකයින් සමඟ සාකච්ඡා කිරීමට ද සිදුවේ. එසේ ම සන්නිදර්ශනාත්මක අනාවරණයක් සිදු කිරීමේ දී සාහිත්‍ය කෘති පරිශීලනයත් විවිධ ජනමාධ්‍ය වැඩසටහන් පරීක්ෂා කිරීමත් සඳහා මෙවැනි අධ්‍යයනයකදී අන්තර්ගත විෂය විශ්ලේෂණ ක්‍රමය (Content Analysis method) ඵලදායී ලෙස භාවිත කිරීමේ දී වැදගත් වනු ඇත.

**සාකච්ඡාව**

ස්ත්‍රීත්වයේ හා පුරුෂත්වයේ නිරූපණය ලිංගය (ලිඞගය) යන්නෙහි මූලික අදහසයි. එය පිරිමි බවේ හා ගැහැනු බවේ ඇඟවුම යන අර්ථයෙන් ද ව්‍යවහාර වේ. එමෙන් ම ස්ත්‍රී වේශය, පුරුෂ වේශය හෝ ස්ත්‍රී-පුරුෂ හැඩරුව යන අදහස ද ගත හැකි ය. "පිරිමි-ගැහැනු ජීවීන් වෙනස් කොට හඳුනාගැනීමට ඉවහල්වන ව්‍යුහමය හා කාර්යමය ලක්ෂණ සමස්තය ලිංගය යන වචනයේ අර්ථයයි" (හරිශ්චන්ද්‍රඃ 2008)

එසේම ලිංගය යන්නෙන් ලකුණ, චිහ්නය, ආකාරය, සටහන යන අර්ථයන් ද කියවේ. ස්ත්‍රී හෝ පුරුෂ ශරීරවලට අනුව ආවේණික ව්‍යුහමය ලක්ෂණ හෙවත් ආකාර, චිහ්න සටහන් අනුව ඔවුනොවුන් වෙන්වෙන් වශයෙන් හඳුනා ගැනීමට හැකිවේ. මෙකී ස්ත්‍රී හා පුරුෂ ලක්ෂණ අනුව ඇතිවන්නා වූ අනන්‍යතාවන්, මානව සමාජයේ ප්‍රධානතම නෛසර්ගික බෙදීම බවට පත්වේ. මෙය මානව සමාජයට පමණක් නොව බොහෝ

සත්ත්වයින්ට ද අදාළවේ. පිරිමි සතුන් හා ගැහැනු සතුන් ශාරීරික ලක්ෂණ අනුව වෙන්වෙන්ව හඳුනාගත හැකිය. ඇතැම් සතුන් දර්ශන මාත්‍රයෙන්ම ගැහැනු පිරිමි වශයෙන් හඳුනාගත හැකි අතර ඇතැම් සතුන්ගේ ඉරියව්, චර්යා ආදී සන්නිවේදනයන් මගින් දැන ගැනීමට හැකිවේ.

ලිංගිකත්වය හා ස්ත්‍රී පුරුෂ භේදය සාමාන්‍ය ව්‍යවහාරයේ යෙදෙන්නේ එකම අර්ථයක් ගෙන එන ලෙස ය. නමුත් මානව විද්‍යාව මෙය එකක් නොව දෙකක් ලෙස දකී. ජීව විද්‍යාත්මකව ස්ත්‍රී පුරුෂ භේදයක් ඇත. ක්‍රෝමසෝම හා හෝමෝන වෙනස කායික වෙනස්කම්වලින් ස්ත්‍රී පුරුෂ භේදය හඳුනාගත හැකිය. ලිංගිකත්වය කියන්නේ ලිංගභේදයට නොව තත්ත්වය හා කාර්යභාරය සලකා පිරිමි-ගැහැනු වෙනස්කමටය. (රත්නපාල, 2001ඃ89)

ඒ අනුව ලිංගය (Sex) සහ ලිංගිකත්වය (Gender) යන ව්‍යවහාරවල වෙනස්කම් පවත්නා බැව් පැහැදිලිවේ. යම් ජීවියෙකු කෙරෙහි පිහිටා ඇති ගැහැනු බව හෝ පිරිමි බව ලිංගය යන්නෙන් අර්ථවත්වේ. සියලු ශරීරාවයවවලින් හා ශරීරාභ්‍යන්තරික ක්‍රියාවලීන් මගින් එය ප්‍රකට වේ. එහෙත් ස්ත්‍රී පුරුෂ භේදය හෙවත් ලිංගභේදය (Gender) සම්බන්ධ අනන්‍යතා ප්‍රකට කරනු ලබන්නේ සමාජ, සංස්කෘතික අවස්ථා හා බලපෑම් පදනම් කර ගනිමිනි. "ලිංගිකත්වය, සමාජ ලිංගිකත්වය, පුම්තිරි බව, ස්ත්‍රී පුරුෂ භාවය, ස්ත්‍රී පුරුෂ සමාජ භාවය යනාදී සිංහල යෙදුම්වලින් අභිප්‍රේත වන්නේ ඉංග්‍රීසි භාෂාවේ ජෙන්ඩර් යන වචනයෙන් කියැවෙන අරුත ඉදිරිපත් කිරීමයි" (අභය සුන්දර 96)

මේ අනුව ලිංගය යන්නෙන් ජීවවිද්‍යාත්මක වශයෙන් ලිංගිකත්වය පිළිබඳ ප්‍රකට කරන අතර, ලිංගිකත්වය (Gender) යන්නෙන් සමාජ විද්‍යාත්මක අනාවරණයන් සිදුවේ. මෙම අධ්‍යයනයේදී මෙකී පාර්ශව දෙකම පිළිබඳ අවධානය යොමු කිරීමට සිදුවේ. එයට හේතුව ලිංගිකත්ව සන්නිවේදනය (Sexual communication) ජීවවිද්‍යාත්මක හා සමාජ විද්‍යාත්මක ලක්ෂණ සහිතව ක්‍රියාත්මක වන බැවිනි. මිනිසුන් පිළිබඳ කරන අධ්‍යයනවලදී ඊට සම්බන්ධවන ඕනෑම අයෙක් ගැහැනියක් හෝ පිරිමියෙක් ලෙස හඳුනා ගැනීමට පුළුවන. ඒ අනුව ඔවුනගේ කායික ස්වරූප, මානසික ස්වරූප ආදිය ගැහැණු - පිරිමි ලක්ෂණවලට අනුව තීරණය වේ. එසේම ඔවුන් කරන ඕනෑම කටයුත්තක් වුව ද ඔවුනගේ ලිංගිකත්වය මත පදනම් වී ඇත. ගැහැණු නම් පිරිමි නම්, ගැහැණු වැඩ පිරිමි වැඩ, ගැහැනු කතා පිරිමි කතා, ගැහැනු ඇඳුම් පිරිමි ඇඳුම් යනාදී වශයෙන් ජෛවීය සාධක මෙන්ම සමාජීය සාධක ද ලිංගිකත්වය නියෝජනය කරන බැව් ප්‍රකට කරුණකි.

අන් සියල්ලකටම වඩා මානව සන්නිවේදනය කෙරෙහි බලපාන්නේ පුද්ගලයාගේ ජෛවීය ලක්ෂණයි. යමක් ක්‍රියාත්මක වන්නේ පණ ඇති බව හෙවත් සජීවි බව නිසාය. සජීවි බව රැඳෙන ඕනෑම අයෙක් සන්නිවේදනාත්මකය. පණ ඇති සජීවී අයෙකුට දැනෙන සුළු බව පවතී. එනම් සංවේදී ඉන්ද්‍රිය සක්‍රීයව පවතින බවය. ඇස, කණ, නාසය, දිව, ශරීරය හා මන යන ඉන්ද්‍රියයන් සන්නිවේදනයට සම්බන්ධ ජෛවීය මාධ්‍ය බවට පත් වේ. ලෝකයේ කුමනාකාර තාක්ෂණික මෙවලමකින් වුව ද සිදුවන සන්නිවේදනයක් මිනිසා වෙතට ගෙන යාමට යථෝක්ත සංවේදී ඉන්ද්‍රිය මාධ්‍ය භාවිත කළ යුතු වේ. ස්ත්‍රී-පුරුෂ වශයෙන් හඳුනා ගන්නා මානව ප්‍රභේදයන් ද ඉහත කී ජෛව සාධක නියෝජනය කරන බැවින් ඔවුන් සන්නිවේදනික සත්තත්ව කොට්ඨාසයක් බවට පත් වේ.

"ලිංගය (සෙක්ස්) සහ ලිංගිකත්වය (ජෙන්ඩර්) අතර වෙනස කතා කළ මුල්ම තැනැත්තා ලෙස සැලකෙන්නේ ඇමරිකානු මනෝ විශ්ලේෂකයකු වූ රොබට් ස්ටෝලර් ය. ගැහැනිය හා ගැහැනු බවත් පිරිමියා හා පිරිමි කමත් හැමවිටම සමාජගත වීම අත්‍යවශ්‍ය නොවන බව පැවසූ හෙතෙම ලිංගය හුදු ජීව විද්‍යාත්මක කරුණක් බවත්, ලිංගිකත්වය සමාජ සංස්කෘතික නිර්මිතයක් බවත් කීවේය." (ජයරත්න, 2008;75)

"රෝබට් ස්ටොලර්" තවදුරටත් විග්‍රහ කරන්නේ බාහිර හා අභ්‍යන්තරික ප්‍රජනක ඉන්ද්‍රියන් ලිංග ශෛල හෝමෝන තත්ත්වයන් හා ද්විතික ලිංග චර්යාවන් පැහැදිලිව ස්ත්‍රීන් හා පුරුෂයන් වෙනස් කොට හඳුනා ගැනීමේ සාධක වන බවයි. (ජයසිංහ, 2006;15)


ලිංගික සන්නිවේදනයේ දී සම්පූර්ණ ස්ත්‍රී, පුරුෂ ශරීර සහ මානසික ක්‍රියාකාරිත්වයන්ම අදාළ වේ. බැල්ම, කටහඬ, ආඝ්‍රාණය, ස්පර්ශය ආදිය මගින් සිදුවන සන්නිවේදන ප්‍රබල ලිංගික උත්තේජනයක් දක්වා බලපායි. එසේම කේශ කලාපය, නිය, දත්, තොල්, කම්මුල්, ඇහිබැම, නළල, බෙල්ල, පියයුරු, ළැම, ඉඟ, දෙකලවා, දෙපතුල් ආදී වූ ශරීරාංගවලින් සිදුවන විවිධාකාර සන්නිවේදනයන් ලිංගික සන්නිවේදනයට සම්බන්ධවේ. ඔවුනොවුන් අන්‍යෝන්‍ය වශයෙන් දැන හඳුනාගැනීම්, ආකර්ෂණයන්, අවබෝධකර ගැනීම්, සම්බන්ධතාවන් ඔස්සේ ආදරය, ප්‍රේමය, ආලය, සෙනෙහස, රතිය ආදී මනෝභාවයන් උද්දීපනය කෙරේ. ඒවා ලිංගික සබඳතාවක්, මෛථුන සේවනයක්, සංසර්ගයක් දක්වා වර්ධනය විය හැකිය. එමගින් ඇතිවන්නා වූ රසය, සුරතාන්තය (Orgasm) පුහුදුන් ලොවෙහි පවත්නා උච්චතම රසය වින්දන ක්‍රියාව (Recreational Function) බවට පත්වේ. එය සියලු සෞන්දර්යයන්හි කැටි වූ උච්ච ආස්වාදයයි. ආනන්දනීය රසයයි. ලාලිත්‍යයයි. ඒවටා ලෝකයේ නිර්මාණ ජනිත වීමට අවශ්‍ය පසුබිම සැකසිණ. ඒ සියල්ලටම වඩා විශේෂිත වූ කාර්යභාරය වන්නේ ලිංගික සන්නිවේදනයේ උච්චතම ආස්වාදනීයත්වය තුළින් පුරුෂයාගෙන් නිකුත් වන ශුක්‍රාණුවත් (Sperm) ස්ත්‍රියගෙන් නිකුත් වන ඩිම්බයත් (Cell) සංසේචනය වීම (Insemination) මගින් නිර්මාණය වන ජීවානුව හෙවත් යුක්තානුව (Zygote) නව ජීවියෙකුගේ හට ගැනීමයි. ලිංගිකත්ව සන්නිවේදනයේ උපරිම රස සංජානනය මගින් මානව පරපුර අඛණ්ඩව ඉදිරියට ගෙනයාම සිදුවේ. එහි පරමාර්ථය වර්ගයා බෝ කිරීමයි. මෙය බොහෝ සත්ත්ව කොට්ඨාසයන්ට පමණක් නොව ශාකවල පවා දැකිය හැකි තත්ත්වයකි.

ඒ අනුව මානව සෞන්දර්යයේ ආරම්භයට ඉන්ද්‍රිය ප්‍රබෝධනය මගින් සිදුවන විභාව, අනුභාව ව්‍යභිචාරීභාව සංයෝගය හේතුවේ. එය රස නිෂ්පාදන මාර්ගයයි. ශෘංග ාර, හාස්‍යාදී සියලු රසයන් ජනිත වන්නේ ස්ත්‍රී-පුරුෂ ලිංගිකයන්ගේ ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වය ආශ්‍රයෙනි. ලිංගිකත්ව සන්නිවේදනය (Sexual Communication) සුවිශේෂිත වන්නේ එබැවිනි. ලෝකයේ සකලවිධ වටිනාකම් නිර්මාණයවීමේදී ලිංගිකත්වය තරම් ප්‍රමුඛ වූ අන් සාධකයක් නැති තරම්ය. ආචාරධර්ම, නීති, ශාස්ත්‍ර, සාහිත්‍ය, කලා ආදී සියල්ල කෙරෙහි ලිංගිකත්වය බලපා තිබේ. මව් කුසයට ප්‍රවිෂ්ට වූ ජීවියා සති කීපයකින් ස්ත්‍රියක් ද- පුරුෂයෙක් ද යනුවෙන් තීරණය වන අතර එම ජීවියා වර්ධනය වන්නේ ඊට අනුරූපවය. ඉපදුණු අවස්ථාවේ සිට මරණය දක්වා එම ලක්ෂණය (ස්ත්‍රී - පුරුෂ භාවය) ක්‍රියාත්මකවේ.

## සමාජ සමීක්ෂණය - ආශ්‍රිත දත්ත විශ්ලේෂණය

ප්‍රශ්තුත සමීක්ෂණය සඳහා තෝරාගත් නියැදි ගහණය සියයක් වුවත්, එයින් හැට නවදෙනෙක් (69) අදාළ ප්‍රශ්නාවලිය පුරවා ආපසු ලබාදෙන ලදී. එකී තොරතුරු මෙම විශ්ලේෂණය සඳහා උපයුක්ත කරගැනේ. එහිදී සහේතුක නියැදි ක්‍රමය (Purposive Sampling Method) යටතේ ලිංගික අත්දැකීම්වලට ආසන්න වයස් කාණ්ඩවලට අයත් අභ්‍යන්තර හා බාහිර උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන් කණ්ඩායමක් තෝරා ගැනුණි. ඔවුහු කෑගල්ල, මහනුවර, මාතලේ, කුරුණෑගල, අනුරාධපුරය, පොළොන්නරුව ආදී දිස්ත්‍රික්ක නියෝජනය කරනු ලබත්. මේ නිසා ලංකාවේ සැලකිය යුතු ප්‍රාදේශීය නියෝජනයක් සිදුවීම වැදගත්වේ. වැඩි පිරිසක් විවාහය ආසන්න වන අතර සුළු පිරිසක් පමණක් විවාහකය. එසේම උසස් අධ්‍යාපනය සඳහා කලා පාඨමාලාවන් හදාරන බොහෝ පිරිසක් කාන්තාවන් වන නිසා එය මෙම සමීක්ෂණයට ද බලපා ඇත. ඉතා අඩු පිරිමි විද්‍යාර්ථීන් පිරිසක් පමණක් මෙයට දායකවේ. සියලුම දෙනා උසස් පෙළ දක්වා අධ්‍යාපනය ලබා විශ්වවිද්‍යාල අභ්‍යන්තරව හෝ බාහිරව (දුරස්ථ ක්‍රමයට) උපාධි පාඨමාලාවක් හදාරමින් සිටිති. කලා පාඨමාලාවට සම්බන්ධ විද්‍යාර්ථීන් පමණක් තෝරාගැනීම යම් අන්තගාමී ස්වභාවයක් පෙන්නුම් කළ ද ලිංගිකත්වය හා සම්බන්ධ සෞන්දර්යාත්මක ආකල්ප පිළිබඳ වඩාත්ම කලා විෂයධාරාවන් හදාරන විද්‍යාර්ථීන් වෙතින් ප්‍රකට විය හැකිය යන උපකල්පනය මගින් එය සාධාරණීකරණය කර ගැනීමට උත්සුකවේ. සමීක්ෂණය සඳහා සහභාගී වූ පිරිසගේ වයස් කාණ්ඩ පිළිබඳ ප්‍රස්තාරික නිරූපණය (1-1) අනුව වයස අවුරුදු 22-23 අතර 24 දෙනෙක් ද 24-25 අතර 33 දෙනෙක් ද සහභාගී වූහ. අවුරුදු 22-25ත් අතර 57 දෙනෙක් ප්‍රශ්නාවලිය සඳහා පිළිතුරු ලබාදී ඇත. වයස අවුරුදු 30 ඉක්ම වූ අය 05 දෙනෙක් පමණක් සහභාගී වූහ. ඒ අනුව විවාහාසන්න හෝ නවක විවාපත් පිරිසක් මේ සඳහා සහභාගී කරවාගෙන ඇති බව ප්‍රකටවේ. එය මෙවැනි මාතෘකාවක් සම්බන්ධයෙන් වඩාත් යෝග්‍ය බව දැක්විය හැකිය.

## ටැම් ප්‍රස්තාරික නිරූපණය



එසේම සමීක්ෂණය සඳහා සහභාගී වූ පිරිසෙන් රැකියා නියුක්ත 20.28% ක් වන අතර රැකියා වියුක්ත 79.71% කි. එහිදී රැකියාවල නියුක්ත සහ විවාහක කණ්ඩායම බාහිර උපාධි අපේක්ෂක විද්‍යාර්ථීන්ය. ඒ අනුව මෙම පර්යේෂණය සඳහා යොදාගත් කණ්ඩායම අදාළ මාතෘකාව සඳහා බෙහෙවින් බලපාන බව පැහැදිලි වේ. ඔවුන් ලිංගිකත්වය හා සම්බන්ධවන වයස් කාණ්ඩවල පසුවන අය වන බැවින් මාතෘකාව කෙරෙහි දක්වන ප්‍රතිචාරවල වලංගුභාවය වැඩි විය හැකිය. එහෙත් ප්‍රශ්නාවලිය සම්පූර්ණ කර දීමට ඔවුන් දක්වන ලද්දේ උදාසීන මෙන්ම අතිශය ලජ්ජාශීලී ස්වභාවයකි. ඒ අනුව හැකිතාක් ප්‍රශ්නාවලිය මගින් ප්‍රතිචාරකයා හෝ පෞද්ගලිකත්වය අනාවරණ නොවන පරිදි එම කාර්යය ඉටු කර ගැනීමට වග බලාගන්නා ලද්දේ එබැවිනි. එය මෙරට සමාජ සංස්කෘතික පිළිගැනීම්වල ලිංගිකත්වය හා සම්බන්ධව පවත්නා ආකල්ප, මතිමතාන්තර විය හැකිය. එහෙත් බොහෝ දුරට පෙනී ගියේ අනවශ්‍ය ස්වයං වාරණයක් පවත්වාගෙන කටයුතු කළ බවකි.


ප්‍රශ්නාවලියේ මූලික තොරතුරු ලබාගැනීමට ඉදිරිපත් කරන ලද්දේ ලිංගිකත්වය, විවාහක අවිවාහක බව, වයස, පදිංචි දිස්ත්‍රික්කය, ජනවර්ගය, ආගම, අධ්‍යාපන තත්ත්වය වැනි පොදු තොරතුරු දැන ගැනීමට සුදුසු ප්‍රශ්නය. එහෙත් මාතෘකාව කේන්ද්‍ර කරගත් ප්‍රශ්න 44ක් ඉදිරිපත් කරන ලදී. ඒවායෙන් බොහෝමයක් ඍජු, විවෘත ප්‍රශ්න වූ අතර බහුවරණ ප්‍රශ්න කීපයක් ද ලබාදී තිබුණි. එසේම නිදහස්ව ප්‍රතිචාරකයාගේ අදහස් දැක්වීම සඳහන් ප්‍රශ්න 05ක් පමණ ලබාදී ඇත. බහුතරයක් දෙනා සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයා තිබුණ ද ඇතමෙක්, ඇතැම් ප්‍රශ්නවලින් මගහැර තිබූ බව ද ප්‍රකටවේ. එසේම බහුතරයක් විශ්වසනීය වූ පිළිතුරු ලබාදී තිබුණ ද ඇතැමුන් යම් සැඟවුණු හෝ වංචනික හෝ පිළිතුරු ලබාදී ඇති බව ද පෙනේ. ඔවුන් විසින් ලබා දෙන ලද කවරාකාර පිළිතුරක් වුව ද අපගේ ප්‍රස්තුත තේමාව පෝෂණය කරනු ලබන ප්‍රතිචාර ලෙස බාර ගනිමින් මෙම විශ්ලේෂණය සිදු කිරීමට උත්සුක වී ඇත.

අධ්‍යයනය සඳහා තෝරාගත් පිරිසෙන් බහුතරයක් එනම් 79.7% විධිමත් ලිංගික අධ්‍යාපනයක් ලබා නැති බවත් 20.28% ක් යම් අධ්‍යාපනයක් ලබා ඇති බවත් පිළිගෙන තිබේ. ඍජුවම විවාහක හෝ විවාහාපේක්ෂකව සිටින මෙවැනි කණ්ඩායමක 80% ක පමණ ප්‍රතිශතයක් විධිමත් ලිංගික අධ්‍යාපනයක් නොමැති වීම සමාජමය වශයෙන් මෙන්ම පෞද්ගලික වශයෙන් ද ගැටලු සහගත තත්ත්වයක් ඇති වීමට බලපාන බව සිතිය හැකිය. විධිමත් අධ්‍යාපනයක් නොමැති වුව ද ලිංගිකත්වය පිළිබඳ අවබෝධය පිළිබඳ විමසන කල්හි තරමක් හොඳයි යනුවෙන් 39.16% ක් ද හොඳයි යනුවෙන් 40.5% ක් ද ඉතා හොඳයි යනුවෙන් 1.4% ක් ද ප්‍රමාණවත් නැත යනුවෙන් 18.8% ක් ද පිළිතුරු ලබාදී තිබුණි. ඒ අනුව දළ වශයෙන් 75% කට පමණ ලිංගිකත්වය පිළිබඳ අවබෝධයක් පවතින බව පැහැදිලිවේ. (1.2 ප්‍රස්තාරික නිරූපණය)


**ලිංගිකත්වය පිළිබඳ අවබෝධය වාත්ත ප්‍රස්තාරික නිරූපණ**

එබැවින් විධිමත් පරිදි ලිංගික අධ්‍යාපනයක් ලබා නැති වුව ද සාමාන්‍ය වශයෙන් ලිංගිකත්වය පිළිබඳ අවබෝධයක් පවතී. ලිංගික කරුණු සම්බන්ධව විවෘතව සාකච්ඡා කිරීමට 44.92% කැමැත්ත ප්‍රකාශ කර ඇත. එහෙත් 46.37% ක් අකමැති අතරම


8.19% ක් කිසිම පිළිතුරක් ලබාදී නැත. සාමාන්‍යයෙන් 50% කට ආසන්න සංඛ්‍යාවක් ලිංගිකත්වය පිළිබඳ කරුණු විවෘතව සාකච්ඡා කිරීමට කැමැත්ත පළ කර තිබීම විශේෂත්වයකි. ලිංගිකත්වය සම්බන්ධව සැලකිය යුතු අවබෝධයක් පවත්නා පිරිසක් මෙම නියැදිය නියෝජනය කරති. නමුත් එම අවබෝධය ලබාගන්නේ කුමන මාර්ගවලින්දැයි වරණය කිරීමට සාධක කීපයක් ලබා දුනි. ඇතමෙක් පිළිතුරු කීපයක් ද වරණය කර ඇත. ඒ අනුව 27.53% ක් දෙමව්පියන්ගෙන් ද 44.92% ගුරුවරුන්ගෙන් ද කරුණු දැනගෙන තිබේ. වෛද්‍ය උපදෙස් මාර්ගයෙන් 4.73 ක් ද යහලුවන්ගෙන් 37.68% ක් ද දැනගෙන ඇති අතර පොත්පත් හෝ මාධ්‍ය භාවිතයෙන් 53.62% ක් දැනගෙන තිබීම විශේෂත්වයකි. සහකරු සහකාරිය හෝ පෙම්වතා පෙම්වතිය මාර්ගයෙන් 14.49% ක් ද වෙනත් ක්‍රම මගින් 2.89% ක් ද පිළිතුරක් නොදුන් 7.24% ක් ද වශයෙන් දක්වා තිබේ. මෙහි දී වඩාත්ම වැදගත් කරුණක් ලෙස ලිංගිකත්වය පිළිබඳ තොරතුරු දැනගැනීමේදී 50% කට වැඩි ප්‍රමාණයක් පොත්පත් හෝ මාධ්‍ය භාවිත කර තිබේ. ලිංගිකත්වය හා සන්නිවේදනය සම්බන්ධව එය ඉතාම ප්‍රබල තොරතුරක් බවට පත් වේ.




මේ වන විට ජීවිතයේ කිසියම් ලිංගික ආස්වාදයක් ලබා තිබේද? යන පැනයේදී 28.18% එසේ ලබා ඇති බවට ද 75.36% ලබා නැති බව ද දක්වා ඇති අතර 1.4% ක් කිසිදු පිළිතුරක් ලබා දී නැත. වයස අවුරුදු 22ත් 30ත් අතර තරුණ පිරිසකගෙන් 75% ක බහුතරයක් යම්කිසි ලිංගික ආස්වාදයක් ලබා නොතිබීම ද සැලකිය යුතු කරුණකි. ලිංගිකව හැසිරී ඇති පිරිසෙන් 5.79% ස්වයංව ද 10.14% ක් සහකරු හෝ සහකාරියගෙන් (ස්වාමි - භාර්යා) ද 7.2% පෙම්වතා හෝ පෙම්වතියගෙන් ද ආස්වාදය ලබා ඇති අතර කිසිවෙක් සමලිංගිකව හෝ වෙනත් ක්‍රමයකින් ආස්වාදය ලබා නොමැත. අඩුම වශයෙන් ස්වයංව හෝ ලිංගික ආස්වාදයක් ලබා නොතිබීම යනු තොරතුරක් ලෙස විශ්වාස කිරීමට තරම් අපහසු වූ තත්ත්වයකි. ඇතැම්විට තෝරාගත් නියැදිය නියෝජනය කරන්නේ බහුතරයක් ගැහැනු ළමුන් වන බැවින් එය අප වැනි සමාජ සංස්කෘතික වටපිටාවක සත්‍ය තත්ත්වයක් විය හැකි බව ද විශ්වාස කළ හැකිය. දරුවන් ලොකු මහත් වන තුරුම එකම අවශ්‍යතාව අධ්‍යාපනය ලෙස මතුකළ වටපිටාවක එවැන්නක් සාධාරණය.




සමීක්ෂණය සඳහා යොදාගත් සියලුම දෙනා කිසිදු ලිංගික රෝගයකින් නොපෙළෙන බවත් ඒ සඳහා කිසිදු ප්‍රතිකාරයක් ලබාගෙන නැති බවත් දක්වා ඇත. එය සත්‍යයක් ලෙස පිළිගත්ත ද අවම වශයෙන් මොවුන් ඔපස් වේදනාවට හෝ වේදනානාශක ඖෂධයක් හෝ භාවිත නොකළේ ද? යන ගැටලුව පර්යේෂකයාගේ පාර්ශවයෙන් නැගීම ද අසාධාරණ නොවේ. එයින් ගම්‍ය වන්නේ ඇතැම් ප්‍රශ්නවලට පිළිතුරු ලබා දීමේදී ගැඹුරින් සිතා නොබැලීමත් ලබාදෙන පිළිතුරු තමාගේ අනාගත ජීවිතය කෙරෙහි අනිසි ලෙස බලපෑ හැකිය යන අවිශ්වාසනීය පදනම මත පිහිටීමත් හේතුවී ඇති බවයි. ලිංගික අධ්‍යාපනයක් ලබාදීමේදී වඩාත් සුදුසු වයස් කාණ්ඩය ලකුණු කර ඇත. (1.4) ප්‍රස්තාරික නිරූපණය. එහිදී 12-14ත් යන වයස් කාණ්ඩය 30.43 ක් ද 15-18 යන වයස් කාණ්ඩය 50.72% ක් ද 19-22 වයස් කාණ්ඩය 15.94% ක් ද 22ට වැඩි 14.49% ක් ද දක්වා ඇත. ඒ අනුව වයස අවුරුදු 12-19ත් අතර කාල සීමාව ලිංගික අධ්‍යාපනයක් ලැබීමට යෝග්‍ය වයස ලෙස දක්වා තිබේ.




මෙයින් පැහැදිලි වන්නේ නව යොවුන්විය ආරම්භයත් සමග ලිංගිකත්වය පිළිබඳ අධ්‍යාපනයක් ලබාදීම යෝග්‍ය බවයි. එය පාසල් විෂයමාලාවන්ට සමගාමී ලෙස ලබාදීම ද යෝග්‍ය බව ප්‍රකට වන්නේ වඩාත්ම වරණය කර ඇති වයස් කාණ්ඩයන් පුද්ගලයකුගේ පාසල් කාලය නියෝජනය කරන බැවිනි. එසේම ලබාදෙන අධ්‍යාපනය විධිමත් ආකාරයට

ලබා දිය යුතු බව 79.71% ක්ම දක්වා තිබේ. එනම් පාසල් විෂය මාලාවන්ට ඇතුළත් කළ පාඨමාලාවක් විය යුතු බවයි. එය අවිධිමත් හෝ නොවිධිමත් ආකාරයට සිදු විය යුතු බව දක්වන්නේ 23% ක් පමණය. විවාහවීමට පෙර ලිංගික අධ්‍යාපනයක් ලැබිය යුතු බව 88.4% ක් දක්වා ඇති අතර 11.59% ක් එසේ නොවිය යුතු බව පෙන්වා දී ඇත. එහිදී බහුතරයක් වන අවිවාහක පිරිසක්, විවාහයට පෙර ලිංගික අධ්‍යාපනයක් තිබිය යුතු යැයි දැක්වීමෙන් ප්‍රකට වන්නේ විවාහ ජීවිතය සාර්ථකව ගොඩනගා ගැනීමට නම් විවාහයට පෙර කිසියම් ලිංගික අධ්‍යාපනයක් ලැබිය යුතු බවයි. එය යහපත් මට්ටමේ ප්‍රතිචාරයක්වේ. එසේම නව යොවුන් වියේ සිට, නැතිනම් පාසල් අවධියේ සිට ඒ සඳහා අධ්‍යාපනික සූදානමක අවශ්‍යතාව තවදුරටත් තහවුරු කිරීමක් ලෙස ද මෙය පෙන්වා දිය හැකිය.

ලාංකේය සමාජයේ ස්ත්‍රියකගේ ලිංගිකත්වය පිළිබඳ සැලකිලිමත් වීමේදී ''කන්‍යාභාවය'' ප්‍රබල තේමාවක් බවට පත්ව ඇත. ඒ අනුව කන්‍යාභාවය හා ස්ත්‍රී පතිව්‍රතාව පිළිගන්නා බව 50.72% ක් දක්වා ඇත. 43.47% ක් පිළිනොගන්නා බව ද පෙන්වා දී ඇත. සාම්ප්‍රදායික පිළිග ැනීමක් මෙන්ම සමාජ චාරිත්‍රයක් ලෙස කාන්තා පතිව්‍රතාව හා කන්‍යාභාවය වෙනස්විය යුතු බව පිළිගන්නේ 50% කට ආසන්න පිරිසකි. එය එසේම පැවතිය යුතු බව ද 50% ක් පමණ පිළිගෙන ඇත. කාලයක් තිස්සේ සමාජයේ තහවුරු වී තිබූ එවැනි පිළිගැනීම්වල ඇතැම් තත්ත්වයන් වෙනස් විය යුතු වුව ද ඒ සඳහා එකවරම සමාජය සූදානම් නැති බවත් මෙයින් ප්‍රකටවේ. එසේම මෙම සමීක්ෂණය සඳහා සහභාගී වූ පිරිසෙන් කිසිවෙක් ලිංගික දූෂණයට හෝ අපයෝජනයට ලක්ව නැති බව දක්වා ඇත. විවාහයට පෙර ලිංගික සබඳතා පැවැත්වීම යෝග්‍ය නොවන බව 92.75% ක්ම දක්වන අතර 5.79% ක් දක්වා ඇත්තේ එය සුදුසු වන බවයි. එමෙන්ම විවාහය සිදුවිය යුත්තේ ප්‍රේම සම්බන්ධයකින් බව 88.4% ක්ම පිළිගනිති. යෝජනාවක් මගින් බව 18.84% ද දක්වා ඇත. එහි දී ඇතැමෙක් වරණයන් එකට වැඩි ප්‍රමාණයක් පළකර තිබුණි. නිදහස් ලිංගික චර්යාවන් පිළිගන්නේ ද යන පැනයට පිළිතුරු ලෙස 55.07% පිළිගන්නා බවත් 31.88% පිළි නොගන්නා බවත් ලකුණු කර තිබුණි. කිසිම තොරතුරක් නොදුන් සංඛ්‍යාව 13.09% කි. එබැවින් ලිංගිකත්වය සම්බන්ධයෙන් පවත්නා යම් යම් සීමාවන් බැහැරවිය යුතු බව 55.07% වැනි බහුතර සංඛ්‍යාවක් පිළිගෙන තිබීම ද විශේෂත්වයකි. ලිංගිකත්වය නීති මගින් පාලනය කිරීමට නොහැකි බව 75.36% දක්වා ඇති අතර පාලනය කළ හැකිය යන්න 21.73% දක්වා තිබේ. එයින් වක්‍රාකාර ලෙස නිදහස් ලිංගික චර්යාවන් පිළිබඳ අවශ්‍යතාව ද ගම්‍යමාන වේ. සමීක්ෂණයට සහභාගී වූ කිසිවෙක් අයතා ලිංගික සබඳතා අනුමත නොකරයි. එනම් සමාජ සංස්කෘතික වටිනාකම්වලට ආදාළ සීමාවන්හි සිට ලිංගිකත්වයෙහි යෙදීම සුදුසු බවයි. කිසිවෙක් සමලිංගික හැසිරීම් අනුමත නොකරන අතර, එසේ හැසිරී නැති බව ද දක්වා තිබේ. එසේ ලිංගික චර්යාවෙහි නියුක්ත විය යුක්තේ එක් අයකු සමඟ පමණක් බවත්, එයට හේතුව විවිධ සමාජ රෝගාදියෙන් මිදීම සමාජ සංස්කෘතික වටිනාකම්වලට අනුගාමීව, විවාහ ජීවිතයේ ප්‍රශ්නවලින් අත්මිදීම යනාදිය දක්වා ඇත.


සාම්ප්‍රදායික සමාජ සංස්කෘතික වටපිටාවන්වල ක්‍රියාත්මකවන ලිංගික වත් පිළිවෙත් යනාදිය පිළිගන්නා බවට 42.02% ක් දක්වා ඇති අතර පිළිනොගන්නා බව 49.27% ක් දක්වයි. පිළිතුරක් ලබා නොදුන් සංඛ්‍යාව 8.6% කී. මෙයින් ද ගම්‍ය වන්නේ 50% කට වැඩි පිරිසක්

පැරණි ලිංගික වත් පිළිවෙත් චර්යා හා පිළිගැනීම් ආදිය වෙනස් විය යුතු බව, තහවුරු කරන බවකි. ලිංගිකත්වය හා මාධ්‍ය භාවිතයට අදාළ ප්‍රශ්නවලට ද සාධනීය පිළිතුරු ඉදිරිපත් වී ඇත. සමීක්ෂණයට සහභාගී වූ පිරිසෙන් ලිංගිකත්වය සහිත චිත්‍රපට නරඹා ඇත්තේ 26.08% කි. නරඹා නැති ප්‍රමාණය 84.05% කි. එසේ ලිංගිකත්වය සහිත වීඩියෝ, ශ්‍රව්‍ය දෘශ්‍ය ආදිය නරඹා ඇති සංඛ්‍යාව 15.94% ක් වන අතර නරඹා නැති සංඛ්‍යාව 79.71% කි. අන්තර්ජාලය හා වෙනත් ජාලගත මාධ්‍ය හරහා ලිංගිකත්වය සහිත වැඩසටහන් නැරඹූ සංඛ්‍යාව 4.34% කි. නරඹා නැති ප්‍රමාණය 92.75% ක් වේ. ලිංගිකත්වය සහිත පොත්පත්, පුවත්පත් ඇතුළු මුද්‍රිත මාධ්‍ය භාවිත කළ සංඛ්‍යාව 39.13% කි.කියවා නැති සංඛ්‍යාව 57.97% ක් වේ. මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් කිසිම පිළිතුරක් ලබා නොදුන් 2.89% සිට 4.34% දක්වා පිරිසක් ද වූහ.

ප්‍රස්තුත කේන්ද්‍රීය ගැටලුව වන ලිංගිකත්වයේ දී මාධ්‍ය භාවිතය සැලකිය යුතු බලපෑමක් සිදු නොකරන බව මෙම දත්තවලින් අනාවරණ වේ. යම්තාක් දුරට හෝ බලපෑමක් සිදුකර තිබෙන්නේ මුද්‍රිත මාධ්‍ය පත පොත ය. එහෙත් අප උපන්‍යාසයන් වූයේ සාපේක්ෂ වශයෙන් නූතන මාධ්‍ය (Modern Media) යටතේ රූපවාහිනිය හා වීඩියෝ මාධ්‍ය මෙන්ම චිත්‍රපටය වැනි මාධ්‍යයත්, නව මාධ්‍ය (New Media) යටතේ අන්තර්ජාලය ඇතුළු මාධ්‍යයන් ප්‍රබල බලපෑමක් සිදු කරන බවයි. එහෙත් ප්‍රශ්නාවලී මගින් ලබා දී ඇති තොරතුරුවලින් ගම්‍ය වන්නේ, අපගේ උපන්‍යාසය ස්වායත්ත විචල්‍යයෙන් හෙවත් මුඛ්‍ය ගැටලුවෙන් ඈත්වන අතර ඒ සඳහා වෙනත් විචල්‍යයන්ගේ බලපෑමක් සිදුවන බවකි. තෝරාගත් නියැදි ගහණයට අදාළ තොරතුරු සැඟවීමට හෝ වංචනික ලෙස පිළිතුරු ලබාදීමට ද සාධාරණ වූ හේතුවක් නැත. යථෝක්ත මාධ්‍යවලට සම්බන්ධ ලිංගික වැඩසටහන්වලින් යම් ආස්වාදයක් ලබන බව 24.63% ක් දක්වා ඇති නමුත් 72.46% දක්වන්නේ කිසිදු ආස්වාදයක් නොලැබූ බවයි. එනම් එම මාධ්‍ය භාවිත නොකිරීම යන්න වෙනත් ආකාරයකින් දක්වා ඇත. මාධ්‍ය භාවිත කළේ නම් කිසියම් වූ හෝ ආස්වාදයක් ලැබීමට යොමුවිය යුතු ය. එසේම මාධ්‍ය භාවිත කළ අයගෙන් 7.24% ක් එකී වැඩසටහන් ජීවිතයට ප්‍රායෝගික වශයෙන් එකතු කරගත් බව දක්වා ඇත. එහෙත් 92.75% ක්ම දක්වන්නේ ජීවිතයට යමක් ලිංගිකත්වය සහිත වැඩසටහන්වලින් එකතු නොකර ගත් බවයි. එවැනි වැඩසටහන් සඳහා කිසිවෙකුත් ඇබ්බැහි නොවුණු බව පෙන්වා දී ඇත. එහෙත් මාධ්‍ය මගින් ඉදිරිපත් වන ලිංගිකත්ව වැඩසටහන්වල උසස් ආස්වාදයක් ඇති බව 5.79% ක් පෙන්වා දෙන අතර 79.71% ක් එවැනි ආස්වාදයක් නොලබන බවත් වෙනත් 14.49% ක් වශයෙන් පිළිතුරු ලබා දී ඇත. එකී වැඩසටහන්වල අධ්‍යාපනික ගුණය විමර්ශනය කිරීමේදී 37.68% දක්වන්නේ යම් අධ්‍යාපනයක් ලැබෙන බවයි. 56.52% ක් තහවුරු කරන්නේ අධ්‍යාපනික වශයෙන් එතරම් වැදගත් කමක් නොමැති බවකි. එසේම එම වැඩසටහන් විද්‍යාත්මක පදනමකින් සකස් වී ඇති බවය. මෙයින් අභ්‍යන්තරිකව ප්‍රකටවන අදහසක් වන්නේ, උසස් අධ්‍යාපනික ගුණයකින් හා විද්‍යාත්මක පදනමක් සහිතව ලිංගිකත්ව වැඩසටහන් නිර්මාණය වීම වැදගත් වන බවයි.

වසර ගණනක් (05 ක් පමණ) අප රට අන්තර්ජාල භාවිතය හා සම්බන්ධ එක් ක්ෂේත්‍රයකදී ලෝකයේ අංක එක (01) බවට පත් වන බවට තොරතුරු වාර්තා විය. එනම් ගූගල් සෙවීම්වල ද (Google Searching) වඩාත්ම භාවිත කර ඇති වචනය (Sex) (ලිංගය) යන්නයි. එසේ භාවිත කිරීම පිළි ගන්නා බවට 43.47% ක් දක්වා ඇති අතර පිළි නොග

න්නා බවට 56.52% ක් පෙන්වා දී ඇත. මෙම සමීක්ෂණයට යොදා ගත් වයස් කාණ්ඩයට පෙර අවුරුදු 15 ත් 20ත් අතර වයස් කාණ්ඩය විසින් වඩාත්ම Sex (ලිංගය) යන යෙදුම ගූගල් සෙවුමෙහි (Google Search) භාවිත කර තිබූ බවට වාර්තා විය. එය ලෝකයේම අංක එක (01) ස්ථානයට වසර ගණනාවක් සිදු කිරීම යනු විමර්ශනයට භාජනය විය යුතු තත්වයකි. නව යොවුන් සහ යොවුන් වියේ පසු වන අයට පොදු වූ ලිංගික කුතුහලය වැනි මනෝ භාවයන් නිසා සිදුවන්නක් ද? නැතිනම් පරිණත ලිංගික අත්දැකීම් ලබා ගැනීමට පෙළඹීමක් ද? සමාජයේ සිදුවන දූෂණ, අපයෝජන වැනි ලිංගික අපරාධ ක්‍රියා කෙරෙහි මෙවැනි ක්‍රියාකාරකම්වල බලපෑමක් තිබේද? යනාදී ගැටලු රාශියක් අප හමුවේ. උත්පන්නවේ. මෙවැනි භාවිතයක් හේතුවෙන් ලාංකිකයා තුළ වඩාත්ම ප්‍රකට වන්නේ කුමක්ද? යන පැනයට වරණය කළ පිළිතුරු කීපයකි. ලිංගික අධ්‍යාපනය පිළිබඳ තත්ත්වය යන්නට 1.4% ක්ද, ලිංගික අසහනය 21.73% ක්ද, අනවබෝධය යන්නට 40.57% ක්ද, කුතුහලය යන්නට 49.27% ක්ද, වින්දනයට ඇති කැමැත්තට 8.6% ක්ද, පිළිතුරු නොදුන් 2.8 ක්ද, වෙනත් 1.4% ක්ද වශයෙන් දක්වා ඇත.




මෙහිදී අසහනය, අනවබෝධය හා කුතුහලය හේතුකොට ගෙන එවැනි දේකට යොමුවන්නට ඇති බවට බොහෝ දෙනෙක් වැඩි ප්‍රතිශතයකින් අනාවරණය කර ඇත. එහිදී කුතුහලය ස්වභාවික වුව ද අසහනය හා අනවබෝධය බැහැර කළ හැකි තත්ත්වයන් ය. ඉටු කළ හැක්කේ කෙසේද? යන්නට අදාළව ලිංගික ආස්වාදය ජීවිතයට අවශ්‍ය බව 94.20% ක් දක්වා ඇති අතර අනවශ්‍යයි යන්න 5.79% ක් පෙන්වා දී ඇත. සදාචාරවත් ලිංගික ඇසුර සෑම දෙනාම අනුමත කර තිබේ. එසේම ලිංගික අධ්‍යාපනය ලැබීමට ජනමාධ්‍ය භාවිත කිරීම යෝග්‍ය බවට 92.75% ක් පිළිගන්නා අතර 3.8% ක් අනවශ්‍ය බව දක්වයි. එසේ ජනමාධ්‍යයේ යොදා ගන්නා ලිංගිකත්වය වස්තුබීජය බවට පත් කරගත් සෞන්දර්යාත්මක වැඩසටහන්වලට 55.07% කැමැත්ත පළකරන අතර 42.02% ක් අකමැතිය. එහෙත් ලිංගික වශයෙන් ශික්ෂණයක් ඇති කැරීමට සෞන්දර්යාත්මක නිර්මාණ අවශ්‍ය බව 81.15% පිළිගන්නා අතර 15.94% ක් අනවශ්‍ය බව පෙන්වාදී ඇත. එසේම ලිංගික අධ්‍යාපනය හා සෞන්දර්යාත්මක ලිංගික වැඩසටහන් සඳහා නිදහස්, අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීමට ද ප්‍රතිචාරක කණ්ඩායම උත්සුක වී ඇත. ලිංගික අධ්‍යාපනය සඳහා ඉදිරිපත් කළ අදහස් අතර,

- පාසල් විෂයමාලාවට ලිංගික අධ්‍යාපනය ඇතුළත් කිරීම.
- විද්‍යාත්මක පදනමකින් යුතුව විෂය නිර්දේශ සකස් කිරීම.
- වයස 12-22 අතර වයස් කාණ්ඩයට ලබාදීම.
- උසස් ප්‍රමිතියකින් යුක්ත වීම.
- පුහුණු ගුරුවරුන් යොදා ගැනීම.
- විශේෂ සම්මන්ත්‍රණ හා වැඩමුළු පැවැත්වීම.
- කණ්ඩායම් අධ්‍යාපන ක්‍රම භාවිත කිරීම.
- ලිංගික කුතුහලය - අනවබෝධය හා අසහනය තුරන් කිරීමට කළමනාකරණය කිරීම.
- අනෙකුත් විෂයයන් මෙන් සාමාන්‍යකරණය කිරීම.
- සදාචාර අධ්‍යාපන ක්‍රම භාවිත කිරීම.
- අනවශ්‍ය සාම්ප්‍රදායික පිළිගැනීම් වෙනස් කිරීම හා සමාජ වටිනාකම් උපයෝගී කර ගැනීම.
- අපයෝජන හා දූෂණ වළක්වා ගැනීමට නීතිමය හා ආචාරධර්මීය පදනම් ශක්තිමත් කිරීම

යනාදිය විශේෂිත ලෙස මතුකර තිබූ කරුණු විය. එසේම සෞන්දර්යාත්මක මාධ්‍ය විෂයෙහිලා ලිංගිකත්ව නිරූපණයේදී උසස් රස වින්දනයක් සහිතවන ආකාරයට එම වැඩසටහන් නිර්මාණය කළ යුතු බව බොහෝ දෙනෙක් දක්වා තිබුණි. ලිංගිකත්වය හා සන්නිවේදනය සම්බන්ධ අදහස් දැක්වීමේදී වුව ද බොහෝ දෙනෙක් මතු කරන ලද්දේ ලිංගික කුතුහලය හා හැඟීම් ඇවිස්සෙන ආකාරයට දක්වන වාර්තා හෝ වෙනත් වැඩසටහන් වෙනුවට ග්‍රාහක අවබෝධය හා රසවින්දනය ඇතිවන පරිදි මාධ්‍ය වැඩසටහන් නිර්මාණය කළ යුතු බවයි.

## සමාලෝචනය

ලිංගිකත්වය, අධ්‍යාපනික හා සෞන්දර්යාත්මක වශයෙන් සන්නිවේදනය කෙරෙහි බලපාන ආකාරය විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ මුඛය අරමුණ විය. ඒ අනුව තෝරාග ත්නා ලද නියැදි ගහනයකට ප්‍රශ්න 50ක පමණ ප්‍රශ්නමාලාවක් ඉදිරිපත් කර ලබා ගත් දත්ත විශ්ලේෂණය කිරීමේදී අනාවරණ වූ තොරතුරු යථෝක්ත විමර්ශනය මගින් සලකා බලන ලදී. ඒ අනුව වයස 22ත් 27ත් අතර වයස් කාණ්ඩවලට අයත්වන බහුතර පිරිසක් ප්‍රශ්නාවලියට පිළිතුරු ලබා දුන්හ. ඔවුන්ගෙන් සීමිත පිරිසක් විවාහක අය වූ අතර බහුතරයක් දෙනා අවිවාහක අය වූ අතර එහෙත් විවාහාසන්න හෝ යෝජිතව හෝ ප්‍රේම සම්බන්ධතා සහිත අය වූහ. මෙවැනි ගැටලුවක් අනාවරණය කර ගැනීමේදී වඩාත්ම යෝග්‍ය වයස් කාණ්ඩය

ලෙස අපගේ වරණය හඳුනාගත හැකිය. ඔවුන් විසින් සපයන ලද තොරතුරුවලට අනුව ලිංගික ජීවිතයක් ගත කිරීම, ආස්වාදයක් ලැබීම මෙන්ම එය විධිමත් විද්‍යාත්මක අධ්‍යාපනයක් සහිතව සිදු කිරීමට අවශ්‍ය වේ. එහිදී සාම්ප්‍රදායික සමාජ වටිනාකම් රැක ගැනීම මෙන්ම සම්ප්‍රදාය තුළ පවත්නා නොවටනා දෑ බැහැර කිරීම ද කාලීන අවශ්‍යතාවක් බවට පත්වේ. විශේෂයෙන් කන්‍යාභාවය, ස්ත්‍රී පතිව්‍රතාව, මිනිසා අපහසුතාවය පත් කරන ගෝත්‍රික වත් පිළිවෙත් ආදිය වෙනස්විය යුතු සාධක ලෙස ප්‍රකට වේ. එහෙත් විවාහයට පෙර ලිංගික සබඳතා පැවැත්වීම සුදුසු නොවන බව බහුතරයක් පිළිගන්නා අතර විවාහය සිදුවිය යුත්තේ ප්‍රේම සම්බන්ධතාවකින් බවත් පිළිගෙන ඇත. එසේ වුවත් බහුතරයක් නිදහස් ලිංගික චර්යා අනුමත කරන අතරම එය වැඩි දෙනෙකුගේ පිළිගැනීමය. කිසිවෙකු අයතා ලිංගික සබඳතා අනුමත නොකරති. සමලිංගික හැසිරීම්වල කිසිවෙක් යෙදී නැති අතර එය අනුමත ද නොකරයි. එසේම ලිංගික ආස්වාදය ලැබීමට සියල්ලෝ එකඟව ඇත්තේ එක් අයෙකු සමග පමණි. එනමුත් සාම්ප්‍රදායික ලිංගික වත් පිළිවෙත් වෙනස් විය යුතු බව 50% ක් පිළිගන්නා බව ද තහවුරු කර ඇත. මේ සියලු දත්තවලින් සමාලෝචනය කළ හැක්කේ අප සමාජයේ තරුණ පිරිස තවමත් ලිංගිකත්වය සම්බන්ධව සමාජ, සංස්කෘතික සම්මතානුකූල භාවිතයන්ගෙන් මෙන්ම අවබෝධයන්ගෙන් යුක්තව කටයුතු කරන බවයි. එසේ වුවත් සාධනීය ලෙස වෙනස්වීමට ඔවුන්ගේ කැමැත්ත ඇති බව ද තහවුරුවේ.

කේන්ද්‍රීය ප්‍රස්තුතය වන ලිංගිකත්වය හා මාධ්‍ය භාවිතය සම්බන්ධයෙන් පර්යේෂකයාගේ උපන්‍යාසයන් බහුල වශයෙන් වෙනස්වන බව පැහැදිලිවේ. සාමාන්‍ය සමාජයේ මෙන්ම පර්යේෂකයාගේ ද උපන්‍යාසය වූයේ තරුණ-තරුණියන්ගේ ලිංගිකත්වය කෙරෙහි චිත්‍රපටය, රූපවාහිනිය, වීඩියෝව ඇතුළු ජන මාධ්‍යයන් ප්‍රබල බලපෑමක් ඇති කරන බවය. ඒත් ප්‍රතිචාරකයින් ලබාදී ඇති තොරතුරු අනුව එය එසේ නොවන බව දක්වා තිබේ. යම් තරමින් හෝ බලපෑමක් සිදුව ඇත්තේ පොත්පත් ඇතුළු මුද්‍රිත මාධ්‍යයන්ය. එය ද 40% කට ආසන්න පිරිසකි. ඒවායෙන් ආස්වාදයක් නොලැබූ බවත්, ජීවිතයට එක්කර නොගත් බවත් බහුතර පිරිසක් දක්වා තිබුණි. එවැනි මාධ්‍ය කෙරෙහි ඇබ්බැහිවීමක් කොහෙත්ම සිදු නොවන බව ද එවැනි වැඩසටහන්වල උසස් රසවින්දනයක් නොමැති බව ද වැඩි පිරිසක් දක්වා ඇත. එසේ වුවත් එමගින් යම් අධ්‍යාපනික ගුණයක් තිබූ බව එම මාධ්‍ය පරිහරණය කළ-නොකළ දෙපාර්ශවයම දක්වා තිබේ. නව මාධ්‍යයක් වන Google Search හි වසර කීපයක්ම ලොව අන් සියලු රටවලට වඩා පළමු තැනට පත්වෙමින් "Sex" යන යෙදුම ශ්‍රී ලාංකිකයා භාවිත කිරීම මගින් ලාංකිකයාගේ ලිංගිකත්වය පිළිබඳ අනවබෝධය, අසහනය හා කුතුහලය ප්‍රකාශයට පත්වන බව වැඩිදෙනෙක් පෙන්වා දෙති. සදාචාරවත් ලිංගික ඇසුර ජීවිතයට අවශ්‍ය බව සියලුම දෙනා පිළිගනිති. එසේම ලිංගික ආස්වාදය ජීවිතයට අත්‍යවශ්‍ය බව ද 94% ක්ම පෙන්වාදී ඇත. ලිංගික අධ්‍යාපනයක් ලබා දීමට ජනමාධ්‍ය භාවිත කළ යුතු හා කළ හැකි බව 92% ක්ම දක්වා තිබේ. එමෙන්ම පැරණි කලා නිර්මාණවල ලිංගිකත්ව නිරූපණය හා සෞන්දර්යාත්මක ලිංගික වැඩසටහන්වලට ඇති කැමැත්ත 50% ක පමණ සීමාවක පැවතිය ද ලිංගික ශික්ෂණය සඳහා සෞන්දර්යාත්මක වැඩසටහන් අවශ්‍ය බව 83% පමණම දක්වා තිබේ.

**නිගමන**

මෙම ප්‍රතිචාරවලින් නිගමනය කළ හැකි කරුණු කීපයකි.

- වයස අවුරුදු 22-30 ත් අතර විවාහක හෝ අවිවාහක උසස් අධ්‍යාපනය ලබන තරුණ -තරුණියන් බහුතරයක් සිනමාව, රූපවාහිනිය, වීඩියෝ මාධ්‍ය හෝ නව මාධ්‍යවල ලිංගික වැඩසටහන්වලට ඇබ්බැහිවීමක් හෝ ජීවිතයට එක්කර ගැනීමක් හෝ ආදර්ශයට ගැනීමක් සිදු නොවේ.

- මාධ්‍ය මගින් ලබාදෙන ලිංගික අධ්‍යාපනය විධිමත්, විද්‍යාත්මක පදනමක් මත සැකසුණු සදාචාරාත්මක වටිනාකම් අනුව සැකසුණු ඒවා විය යුතුය.

- ලිංගික අධ්‍යාපනය සෞන්දර්යාත්මක හා වින්දනීය අයුරින් ගොඩනැගිය යුතු අතරම ඒ සඳහා මාධ්‍ය භාවිත කිරීම යෝග්‍ය වන බවයි.

- ලිංගික ශික්ෂණය ඇති කිරීමේදී සෞන්දර්යාත්මක වැඩසටහන්වල කාර්යභාරය සුවිශේෂවේ. එයට හේතුව උසස් වින්දනාත්මක මනසක් සහිතව කටයුතු කිරීම ලිංගිකත්වයට ද අදාළ වන බැවිනි.

- නව මාධ්‍ය ඇතුළු බොහෝ සමාජජාලාවල "Sex" යන්න ඇතුළු අවිධිමත් ලිංගික ප්‍රදර්ශන හා ප්‍රකාශනාදිය වඩාත්ම සුසර කරන්නේ අනවබෝධය, අසහනය හා කුතුහලය හේතු කොටගෙනය. එබැවින් ලිංගික කුතුහලය දියුණු ලෙස කළමනාකරණය කළ හැකි වන්නේ අවබෝධය හා රසවින්දනය මගින් ගොඩනගන සහනදායී පරිසරයක් මගිනි.

- පාසල් හා උසස් අධ්‍යාපන පාඨමාලාවලට ලිංගිකත්වය පිළිබඳ පාඨමාලා ඇතුළත්විය යුතු අතර ඒවා වයස අවුරුදු 12 සිට 22 තෙක් වයස් කාණ්ඩවල නව යොවුන් විය හා යොවුන් විය දරුවන් ඉලක්ක කරගනිමින් සැකසිය යුතුවේ.

- ලිංගිකත්වය පිළිබඳ අධ්‍යාපනික විෂය නිර්දේශ විද්‍යාත්මක පදනමක් සහිතව සකස් කළ යුතු අතරම ලිංගික සදාචාරය, සමාජ සම්මුතීන් හා වටිනාකම් මෙන්ම නීති පිළිබඳව ද මනා අවධානයක් යොමු කිරීම අත්‍යවශ්‍යවේ.

- ලිංගිකත්වය ජනමාධ්‍යයේදී වඩාත් සෞන්දර්යාත්මක ආස්වාදජනක, වින්දනීය වැඩසටහනක් ලෙස ප්‍රතිනිර්මාණ වීම ලිංගික ශික්ෂණය ඇති කිරීමෙහිලා වඩාත් වැදගත් වනු ඇත.

මෙම නිගමනයන් ලිංගික ශික්ෂණයක් ඇති කිරීමෙහිලා මාධ්‍ය භාවිත කිරීමේදී උපයෝගී කරගත හැකිය. ලංකාව - ඉන්දියාව වැනි රටවල සාහිත්‍ය, සංගීත, චිත්‍ර, නාට්‍ය, චිත්‍රපට, ගීතාදී මාධ්‍ය විෂයෙහිලා ලිංගිකත්ව නිරූපණ ප්‍රබලව සිදුවී ඇත. එහිදී පෙරදිග සෞන්දර්ය දර්ශනය (Aesthetical Philosophy) ගොඩනැගී ඇත්තේ සුඛාන්තමය පදනමක් මතය. විශේෂයෙන් සංස්කෘත සෞන්දර්ය මාධ්‍ය එහිලා කැපී පෙනේ. මේ නිසා වර්තමාන පරම්පරාවන්ගේ ලිංගික අසහනය, කුතුහලය හා අනවබෝධය මාධ්‍ය වඩාත් සාධනීය ලෙස වර්ධනය කළ යුතුවේ.

එසේම ස්ත්‍රීන් සහ පුරුෂයන් අතර සිදුවන අන්තර්වර්ති සහ අන්තර්පුද්ගල සන්නිවේදනයන්හි පවත්නා ජෛව රසායනික හා මනෝවිද්‍යාත්මක සංඥාර්ථවේදීය ප්‍රකාශන ක්‍රම ලිංගිකත්ව සම්බන්ධතා නිර්මාණයෙහිලා බලපාන ආකාරය ගැඹුරු විමර්ශනයට ලක්විය යුත්තකි. ස්ත්‍රී පුරුෂ සන්නිවේදන අනන්‍යතා නිර්මාණය වන්නේ මෙකී ජෛව රසායන ක්‍රියාවලිය ආශ්‍රයෙනි. එසේම එකී ස්ත්‍රී පුරුෂ සබඳතාව මගින් නිකුත්වන සෛල දෙකක් එක්වී යුක්තානුව නම් නව ජීව අණුව නිර්මාණය කිරීමත් එම ජීවියා අනෙකුත් සංවේදක ඉන්ද්‍රියන් සහිතව පරිපූර්ණව ලෝකයට ජනිත වීමත්, මාතෘ පීතෘ සබඳතාවල සිට සකල විධ ගෝලීය සබඳතාත් ගොඩනැගෙන්නේ ලිංගිකත්වයේ ප්‍රතිඵලයන් ලෙසය. ස්ත්‍රී පුරුෂ සමාජභාවී ව්‍යවහාර ගොඩනැගෙන්නේ ද ඊට අනුරූපීවය. එබැවින් ලිංගිකත්වය හා ඒ ආශ්‍රිත සන්නිවේදන ව්‍යවහාර, මානව අධ්‍යාපනය හා රසවින්දනය හෙවත් සෞන්දර්යය කෙරෙහි බලපාන බව ප්‍රකටවේ.

## පරිශීලිත ග්‍රන්ථ

විජේතුංග, හරිශ්චන්ද්‍ර (2008) මහා සිංහල ශබ්ද කෝෂය, ඇම්. ඩී ගුණසේන සහ සමාගම, කොළඹ.

රත්නපාල නන්දසේන (2001), මානව විද්‍යාව, ආරිය ප්‍රකාශකයෝ, වරකාපොල.

අභයසුන්දර, ප්‍රණීත් (2003) මානව සමාජගත පවුල් සංකල්පය, එස්. ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසිංහ,ඒ.කේ.ජී., (2006) ස්ත්‍රී පුරුෂ සමාජභාවය, කඩුල්ල ප්‍රකාශන, කඩවත.)